## Lamb to the Slaughter Roald Dahl

# මරන්න ගෙන ගිය බැටළුවා

පරිවර්තනය- හෙල්මලී ගුණතිලක



උණුසුම්ව, පිරිසිදුව තිබුණු කාමරයේ ජනෙල් තිර වසා තිබිණි. ඇගේ පුටුව අසලත් ඊට ඉදිරියෙන් තිබුණු හිස් පුටුව අසලත් මේස ලාම්පු දල්වා තිබිණි. ඈ පසුපස තිබූ මේසය මත උස වීදුරු දෙකක සෝඩා වතුරත්, විස්කිත් විය. තර්මොස් බඳුනක් අලුත් අයිස් කැටවලින් පුරවා තිබිණි

මේරි මැලෝනි ඇගේ සැමියා රැකියාවෙන් පසු ගෙදර එනතුරු බලාගෙන සිටියා ය. ඇය වරින්වර ඔරලෝසුව දෙස නෙත් යොමු කළේ කලබලයකින් නොවේ. ඈ එසේ කළේ ගතවෙන හැම විනාඩියක් පාසාම ඔහු එන වෙලාව ළඟා වන බව මතක් කරමින් සතුටු වන්නට ය. ඈ වටා පැතිරුණේ මඳහසක ස්වරූපය යි. ඈ කළ හැම දේකම මුදු බව දැවටී තිබිණි. මැහුම වෙත ඇගේ හිස නැමී තිබුණේ නොවූ විරූ නිසල බවකිනි. මේ ඇගේ ගැබිණි බවේ හය වෙනි මාසය නිසා ඇගේ හමේ විනිවිද පෙනෙන ගතියක් තිබුණි. ඇගේ වත පුරා අමුතු සිලිටි බවක් පැතිරී තිබුණු අතර, දෑස අලුත් සෞම්‍ය ගතියකින් පෙරට වඩා විශාලව දිස් විය. ඔරලෝසුවේ වෙලාව පහට දහයක් ලෙස සටහන් වෙද්දී ඈ වඩාත් හොඳින් සවන් දෙන්නට විය. ඉන් සුළු මොහොතකට පසු, හරියටම වේලාවට, එළියේ රථයක් නවත් වන හඬත්, එහි දොරක් වැසෙන හඬත්, කවුළුව අසලින් පිය ගැටෙන හඬත්, දොරේ යතුර කරකැවෙන හඬත් ඇසිණි. ඇය මැහුම පසෙකින් තබා නැගිට ඉදිරියට ගියේ ඔහු එද්දීම හාදුවක් දීමට ය.

''හෙලෝ ඩාලිං'' ඈ කීවා ය.

''හෙලෝ ඩාලිං'' ඔහු පිළිතුරු දුන්නේ ය.

ඇය ඔහුගේ කබාය ගෙන එය අල්මාරියේ රැඳවූවා ය. ඉනික්බිති බීම තබා තිබුණු තැනට ගොස් ඔහුට සැර බවින් වැඩි බීම වඩියක් ද, තමන්ට සැර අඩු වීදුරුවක් ද ගෙනැවිත් නැවත මහමින් සිටි ඇඟලුම අතට ගෙන හිඳගත්තා ය. ඔහු ඇයට ඉදිරිෙයන් ඇති අසුනේ හිඳ, දෑතින්ම උස වීදුරුව කලතමින් සිටියේ එහි වූ අයිස් කැට ගැටී සිහින් හඬක් නැංවෙන ලෙසිණි.

ඇයට නම් මේ දවසේ තෘප්තිකර ම වේලාව යි. පළමු විස්කි වීදුරුව අවසන් වන තුරු ඔහු නිහඬව සිටීමට ප්‍රිය කරන බව ඇය දැන සිටියා ය. දවස පුරාම නිවසේ තනිව ගත කළ දිගු හෝරාවන්ට පසු එළැඹෙන මේ වේලාවේ ඈ ද නිහඬව ඔහුගේ සමාගම විඳින්නට කැමැත්තෙන් සිටියා ය. ඔහු ඇසුරේ දැනෙන සුවය උපරිමයෙන් විඳිමින් ඔහු හා තනි වූ විට ඔහුගෙන් නික්මුණු පිරිමි රශ්මියේ ඈ කිමිදුණේ හිරු රැස් නාන අයෙක් මෙනි. ඔහු දොරකින් ඇතුල් වන ආකාරයට, කාමරයක් හරහා දිගු අඩි තබමින් ඇවිදින ආකාරයට, සැහැල්ලුවෙන් අසුනක හිඳ සිටින ආකාරයට ඈ ආදරය කළා ය. ඔහු ඈ දෙස බලද්දී ඔහුගේ දෑසේ දිස් වූ තියුණු, කල්පනා හරිත පෙනුමටත්, ඔහුගේ මුවේ හැඩයටත් ඈ ප්‍රිය කළා ය. ඒ හැමටත් වඩා ඔහු විස්කි වීදුරුවේ බලයෙන් තමන්ගේ මහන්සිය අඩු වෙන තෙක් ඒ තෙහෙට්ටුව ගැන කිසිවක් නොකීම ගැනත් ඇයට මහත් ආදරයක් දැනුණි.

“මහන්සි ද ඩාලිං?''

“ඔව්'' ඔහු කීය. “හරි මහන්සියි'' එසේ කියූ ඔහු හදිසියේම වෙනදාට නොකරන දෙයක් කළේ ය. ඒ, වීදුරුව ඔසවා එහි ඉතිරි ව තිබුණු විස්කි වඩිය එක හුස්මට මුවට හලා ගැනීම ය . ඇය ඔහු දෙස එක එල්ලේ බලා සිටියේ නැතත් වීදුරුවේ අඩකට වඩා විස්කි තිබුණු බව අයිස් කැට හිස් වීදුරුවේ ගැටෙන හඬින් ඇයට වැටහිණි. පුටුවේ ඉදිරිපසට නැමී මොහොතක් නිසොල්මන් ව උන් ඔහු, නැගිට තවත් විස්කි වීදුරුවක් වත්කර ගැනීම පිණිස සෙමෙන් ඇවිද ගියේ ය.

“මං අරන් දෙන්නම්!'' ඇය හඬ නගා කීවේ පුටුවෙන් වහා වහා නැගිටමිනි.

“වාඩිවෙන්න'' ඔහු කීය.
ඔහු නැවත පැමිණි විට ඔහුගේ අලුත් බීම වඩියේ විස්කි සාන්ද්‍රණය වැඩි කම නිසා එය තද පැහැති බව ඇයට පෙනිණි.

“ඩාලිං, ඔයාගේ සෙරෙප්පු දෙක ගෙනත් දෙන්නද?''

“එපා''
ඔහු අඳුරු පැහැ බීම වීදුරුව තොලගාන අයුරු ඈ බලා සිටියා ය. එහි සැර බව නිසාම තෙල් ගතියෙන් යුතු රැළි නැගෙනු ඇයට පෙනිණි.

“ඔයා තරම් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන්ටත් දවස තිස්සෙම හිටගෙන ඉන්න වෙන එක හරි අසාධාරණයක් කියලායි මට නම් හිතෙන්නේ'' ඈ කීවා ය.

ඔහු කිසිවක් කීවේ නැති නිසා ඇය යළිත් ඇගේ අතේ වූ මැහුම වෙත නෙත යොමු කළා ය. ඔහු වීදුරුව තොලගාන හැම වරකම එහි අයිස් කැට ගැටෙන හඬ ඇයට පැහැදිලි ව ඇසිනි.

“ඩාලිං මම ඔයාට චීස් ටිකක් ගේන්නද? අද බ්‍රහස්පතින්දා නිසා මම රෑට කෑම හැදුවේ නැහැ.''

“එපා'' ඔහු කීය.

“ඔයාට කෑමට එළියට යන්න මහන්සි වැඩි නම් තාම උයන්න පරක්කු වැඩි නැහැ'' ඇය දිගටම කියාගෙන ගියා ය. “ෆ්‍රීසර් එකේ ඕනෑතරම් මස් ජාති තියෙනවා. ඔයාට ඔය පුටුවෙන් නැගිටින්නේවත් නැතිවම කෑම කන්න පුළුවන්''
ඔහුගෙන් පිළිතුරක්, සිනහවක්, කුමක් හෝ සන් කිරීමක් ලැබේදැයි ඇගේ දෑස බලාපොරොත්තුවෙන් විය.

“කොයිකටත් මම ඔයාට මුලින්ම චීස් ටිකක් එක්ක ක්‍රැකර්ස් ටිකක් ගේන්නම්'' ඇය යළිත් කීවා ය.

“මට ඕන නැහැ'' ඔහු කීය.
ඔහු දෙස අයාගත් විශාල දෙනෙතින් යුතුව ඇය නොසන්සුන් ව පුටුවේ හිඳ සිටියා ය.

“ඒත් ඔයා මොනවා හරි කන්න ඕන නේ! මම ලෑස්ති කරන්නම්, එතකොට ඔයාට ඕන නම් කන්න පුළුවන්, අකමැති නම් නොකා ඉන්න පුළුවන්''

ඇය පුටුවෙන් නැගිට මැහුම මේස ලාම්පුව අසලින් තැබුවා ය.

“වාඩිවෙන්න'' ඔහු කීවේය. “විනාඩියකට වාඩිවෙන්න''

ඇයට බියක් දැනෙන්නට වූයේ එවිට ය.

“ඉතින් වාඩිවෙන්න'' ඔහු නැවතත් කීය.
ඇය හෙමින් සීරුවේ පුටුවට පහත් වූයේ කැළඹුණු විශාල දෑස ඔහු දෙස යොමාගත් ගමන්ම ය. ඔහු දෙවෙනි බීම වඩිය අවසන් කර හිස් වීදුරුව තුළට ඔරවාගෙන සිටියේ ය.

“මේ අහන්න'' ඔහු කීය. “මට ඔයාට කියන්න දෙයක් තියෙනවා''

“ඇයි ඩාලිං? මොකක් හරි ප්‍රශ්නයක් ද?''
මේ වෙද්දී ඔහු සම්පූර්ණයෙන්ම නිසොල්මන් ව සිටියේ ය. ඔහු හිස නවා සිටියේ ලාම්පුවේ ආලෝකය මුහුණෙන් කොටසකට වැටී මුව අඳුරේ තිබෙන ලෙස ය. ඔහුගේ වම් ඇස අසල නහරයක් ගැහෙන බව ඇයට පෙනිණි.

“ඔයාට මේක ටිකක් කම්පනයක් වෙයි'' ඔහු කීය. “ඒත් මම සෑහෙන්න කල්පනා කරලා තීරණය කළා ඒක ඔයාට කෙළින්ම කියන එකයි කරන්න ඕන කියලා. ඔයා මට වැඩිය දොස් කියන එකක් නැහැ කියලා මං හිතනවා''

ඉනික්බිති ඔහු ඇයට කීවේ ය. ඒ සඳහා උපරිමයෙන් විනාඩි තුන හතරක් මිස ඊට වැඩි වේලාවක් ගත වූයේ නැත. ඇය බොහෝ සෙයින් නිශ්චලව ඒ සියල්ල අසා සිටියේ කැලඹීමක් මුසු වූ ත්‍රාසයකිනි. ඔහුගේ මුවින් ගිලිහෙන වචනයක් පාසා ඔහු ඇයගෙන් දුරස් වෙමින් සිටියේ ය.

“ඉතින් ඒක තමයි විස්තරය'' ඔහු අවසන් වශයෙන් කී ය. “මං දන්නවා මේ ඔයාට මේක කියන්න හොඳ වෙලාවක් නෙමෙයි කියලා, ඒත් වෙන ගැලපෙන වෙලාවක් එන එකක් නැහැ. මම කොහොමත් ඔයාට සල්ලි දෙන්නම්, ඔයාගේ වැඩ කටයුතු ගැන බලන්නම්. ඒත් ඔයා ප්‍රශ්න ඇති කරන්නේ නැතිවෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. එහෙම වුනොත් මගේ රස්සාවට හොඳ නැහැ''

ඇයට මුලින්ම සිතුණේ ඒ කිසිවක් විශ්වාස නොකර ප්‍රතික්ෂේප කරන්නට ය. සමහරවිට ඔහු කිසි දෙයක් නොකියන්නට ඇති බවත්, මේ සියල්ලම ඈ සිතින් මවා ගන්නට ඇති බවත් ඇයට සිතිණි. සමහරවිට ඈ සුපුරුදු වැඩකටයුතු වල නියැලුනොත්, මේ කිසිවක් නොඇසුණා සේ රඟපෑවොත් ටික වෙලාවක් යද්දී මේ කිසිවක් සිදු නොවූ බව ඇයට දැනෙනු ඇත.

“මම කෑම ලෑස්ති කරන්නම්'' ඇය රහසෙන් මෙන් කියන්නට සමත් විය. මෙවර නම් ඔහු ඇයව වැළකුවේ නැත.

කාමරය හරහා ගමන් කරද්දී ඇයට තමන් පාවෙන බවක් දැනිණි. සුළු අප්පිරියාවක්, ඔක්කාර ගතියක් ඇරෙන්නට ඇයට වෙන කිසිවක් දැනුණේ නැත. ඇය යාන්ත්‍රිකව මෙන් බිම් මහලට ගොස්, විදුලි බුබුල දල්වා, ෆ්‍රීසරය විවර කර, අත ගැටුණු පළමු දේ පිටතට ගත්තා ය. එය ඔතා තිබුණු කඩදා සිය ඉවත් කර ඇය එය දෙස බැලුවා ය. එය බැටළු මස් ගාතයක් විය.

එහෙනම් ඔවුන්ට රෑ කෑමට බැටළු මස් අහාරයට ගනු හැක. මස් ගාතයේ සිහින් කෙළවර දෑතින්ම අල්ලාගෙන ඇය එය යළි උඩුමහලට ගෙන ගියා ය. විසිත්ත කාමරය හරහා යද්දී ඔහු ඇයට පිටුපා කවුළුවෙන් පිටත බලා සිටිනු දැක ඇය නැවතුණා ය. “දෙවියන්ගේ නාමෙට මට කෑම හදන්න එපා'' ඇය නැවත ආ හඬ ඇසුණත් ආපසු හැරී නොබලාම ඔහු කීය. “මම එළියට යනවා''

ඒ මොහොතේ මේරි ඔහු වෙත ඇවිද ගොස්, බිඳක්වත් නොනැවතී, ඈ අත තිබුණු සීතලෙන් ගල් වූ මස් ගාතය ඉහළට ඔසවා හැකි වෙර යොදා ඔහුගේ හිස පසුපසට පහර දුන්නා ය.

එය යකඩ ආයුධයකින් ගැසූ පහරක් තරමට ශක්තිමත් විය.

ඈ අඩියක් පසුපසට ගෙන බලා සිටියා ය. වඩාත්ම පුදුම සහගත කරුණ වූයේ පහර වැදුණු පසු ත් ඔහු තත්පර හතරක් පහක් වැනි වැනී සිටගෙනම පසුවීමයි. ඉන්පසු ඔහු කපා හෙළූ කඳක් සේ බිම ඇද වැටුණි. ඔහු ඇද වැටුණු හඬේ බියකරු බව, ඔහුගේ සිරුරේ ගැටී මේසයක් උඩු යටිකුරු වීම වැනි දේ ඇයව කම්පනයෙන් මුදවා ගැනීමට සමත් විය. ඇය සෙමෙන් සිහි එලවා ගනිමින් සිටියා ය. ඇයට පුදුමයක් ද තද සීතලක් ද දැනෙමින් තිබිණි. වේගයෙන් ඇසිපිය හෙලමින් ඇය ඔහුගේ සිරුර දෙස බලා සිටියේ ඒ විහිලු සහගත මස් ගාතය දෑතින්ම තදින් අල්ලාගත්වනම ය.

හරි, ඈ තමාටම කියාගත්තා ය. මම එයාව මැරුවා.

ඇගේ මනස හදිසියේම නිරවුල් වී තිබුණේ පුදුම සහගත ලෙස ය. ඇය ඉතා වේගයෙන්